ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත
LP - QD / 21/ News/ 2012

ක්‍රි. ව. 2012 දෙසැම්බර් 02 සඳුදා
05 වෙළුම - 07 කලබ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00

# ළමා ප්‍රදීපය



ආගමන කාලය 2012

# සාන්ත නිකුලා මුනිතුමා හෙවත් නත්තල් සීයා

පුංචි ඔබත් නත්තල් සීයාට හිමි ගෞරවය ලබාදෙන්න !

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

# නත්තල් සමයේ නූතන සංකේතය නත්තල් සීයා ?

## ආදරණීය දුවේ පුතේ...

හැම වසරකම නත්තල් සමය උදාවත්ම විවිධ මාධ්‍ය හරහා එක්තරා රූපයක් කළ එළි බට ලනවා. වානිජ මුහුණුවරකට හරවා ගෙන මෙම උත්තරීතර චරිතය හා රූපය විවිධ අරමුණු මත දිස් කරවූවත් එයින් ගම්‍ය වන පොදු හැඟීම වන්නේ නත්තල් සමය ළං ළංව එන බවයි. නත්තලේ මිහිරියාවෙන් පරිසරය වසා ගන්නා බවයි.

''නත්තල් සීයා'' චරිතය අද මෙලෙස උඩු යටිකුරු වූවත් එය කතෝලික සභාවේ සාන්තුවරයෙක්ව සැබවින්ම නිරූපනය කරන චරිතයක් බව අමතක කරන්න එපා. සාන්ත නිකලස් තුමන්ගෙ සැබෑ ආධ්‍යාත්මික හරය හා ක්‍රිස්තු ප්‍රේමය මේ නත්තල් සීයා චරිතය තුළ ගැබ්ව පවතිනවා. මේ වන විට කතෝලික පුංචි ඔබ මේ නත්තල් සීයා චරිතය යටින් දිව යන සාන්ත නිකුලස් තුමන්ගේ ජීවිත කථාන්දරය මැනවින් දන්නවා නේද? එම නිසා එතුමන්ගෙ එම ජීවිත කථාන්දරය නැවතත් මෙම පිටුවෙන් හෙළි කරන්නට උත්සාහ ගන්නේ නැහැ. නමුත් අද වන විට මේ චරිතය මුළු මහත් ලොව පුරා දරුවන්ගේ පමණක් නොව වැඩිහිටියන්ගේත් අවධානය දැඩිව දිනා ඇති බව සඳහන් කරන්නට ඕනා. අවාසනාවකට මේ දැඩි අවධානය විටෙක සාන්ත නිකලස් තුමන්ගේ සැබෑ ජීවිත දැක්ම අවතක්සේරු කිරීමකටත් ලක් කරලා. නමුත් කතෝලිකයන් පමණක් නොව අන්‍ය ආගමිකයන් පවා දැඩිව ආසා කරන මේ චරිතය ඔවුන් අතරින් විවිධ අයුරින් හඳුනා ගැනෙන විට පෙර කී ඒ අවාසනාවන්ත තත්ත්වය ඇතිවෙන්නට පසුබිම සලසා දෙන්නට ඇති. නමුත් එය නිවැරදි කිරීමකට පත් කිරිම කතෝලික පුංචි ඔබේ යුතුකම බව පහදා දෙන්නටයි අද මෙම පිටුවෙන් උත්සාහ කරන්නේ.

ආදර දුවේ පුතේ, අද ''නත්තල් සීයා'' චරිතය මාධ්‍ය මගින් පමණක් නොවෙයි, හැම පුළුල් සන්නිවේදන තලයක් හරහාම ප්‍රබලව පැතිරී ගොස් තිබෙනවා. චිත්‍රපට, ටෙලි සිනමා පට, නවකථා, යොවුන් කථා, හා ළමා කථා අතර දහස් වර මෙම චරිතයට පණ පොවා විවිධාංගිකරනයක් ඔස්සේ චමත්කාර ජනකව ඉදිරිපත් කර තිබෙන බව අද ඉතා පැහැදිලියි.

මෙහිදි විශේෂයෙන්ම අප දකින එක්තරා පොදු තේමා පාඨයක් තිබෙනවා. ඒ තමයි, ''නත්තල් සීයා'' චරිතය තුළින් ළමුන්ට ආදරය කරන ළමුන්ට ගරු කරන, ළමුන් පිළිගන්නා තත්ත්වයක් ඇති කරන්නට උත්සාහ ගෙන තිබීම. නත්තලේ සැබෑ ප්‍රීතිය තිබෙන්නේ කිතුනු ළමා පරපුර තුළයි. අද කිතුනුවන් නොවන අන්‍ය ආගමික ළමුන් පවා දැඩිව නත්තල අගයන්නේ මේ නත්තල් සීයාගේ සැබෑ ආදරයේ සංකේතය ඔවුන් හොඳින් වටහාගෙන තිබෙන බැවිනුයි. ජේසු බිළිඳුන් මෙලොවට ගෙනා සාමයේ ප්‍රීතියේ හා සමානාත්මතාවයේ උත්තරීතර හඬ ශබ්දය නත්තල පුරා නිංනාද දෙන විට ''නත්තල් සීයා'' ප්‍රේමයේ භාෂාවක් සේ ළමුන්ට ඒ ජේසු බිළිඳුන්ගේ ආදරය ප්‍රායෝගිකව අත් දකින හැටි පෙන්වා දෙනවා.

ඉතිං ආදර දුවේ, පුතේ, වානිජ ලෝකය ''නත්තල් සීයා'' සංකේතය සොරා ගෙනයි කියමින් ඒ ගැනම පමණක් මැසිවිලි නැගීමෙන් පලක් වන්නේ නැහැ. ඒ වානිජ ලෝකයේ වැඩිහිටියන්ට ඒ කරන වැරැද්ද දැනෙන්නට ඔබ ළමා ලෝකය දිග් විජය කරන්නට ඕනා. කිතුනු නොවන අන් දරුවනට මෙහි තිබෙන සැබෑ ආධ්‍යාත්මික ගුණය ගැන පවසන්නට පුංචි ඔබ පෙරමුණ ගන්න ඕනා. ජේසු බිළිඳුන්ගේ ඒ මහා ප්‍රේමය හා කරුණාව ගැන ඔබේ වචනයෙන් අන් දරුවන් හා සමග බෙදා ගන්නට ඕනා.

ඇත්තෙන්ම ආදර දුවේ පුතේ, මේ නත්තල් සමය තුළදී ''නත්තල් සීයා'' සංකේතයක් කර ගනිමින් ජේසු බිළිඳුන් ගැන අන්‍ය ආගමිකයින්ට හා අවට පරිසරයට පවසන්නට පුංචි ඔබ ධෛර්යවන්තව පෙරමුණ ගන්නවා නම් ක්‍රම ක්‍රමයෙන් ''නත්තල් සීයා'' සංකේතය නිවැරදිව භාවිත කරන්නට අන්‍ය ආගමික වානිජ ලෝකය පුරුදු පුහුණු වේවි. අපි එතැනට ගමන් කරන්න ඕනා.

''නත්තල '' හා එහි කථාන්දරය ඉතා ප්‍රබලයි. ඒ නිසාම නේද කිතුනුවන් සුළුතරයක් මේ රටේ ජීවත් වූවත් නත්තලේ සැබෑ මිහිරියාව රටේ බහුතරයක්ම විඳ ගන්නට සැරසෙන්නේ. අපි ක්‍රමිකව ඒ අයට උගන්වමු, අපේ කිතුනු සංකේත නිවැරදිව භාවිත කළ යුත්තේ කෙසේද යන්න. ඉතිං නත්තල අපිට ඒ සඳහා හොඳ තෝතැන්නක් සකස් කර දෙනවා. අපි මෙය නව ධර්මදනය කියලා නම් කරමු.

මෙවර නත්තල පුංචි ඔබට නව ධර්මදනයේ අත්දැකීමක් වන්නට ඕනා. නත්තල් සීයා සංකේතයේ සැබෑ කථාන්දරය සමග ඔබ අන් අය වෙතට ගමන් කළ යුතුයි. නිතරම සුබවාදිව අපි මේ සියල්ල කුඩා කල සිට අත් දකිනවා නම් ලෝකයා මොන ප්‍රති ක්‍රියාව අනුව අරමුණු එළිදැක්වුවත් ඒවා ආධ්‍යාත්මිකව වෙනස් කරන්නට අපට පුළුවන් බව අපේ විශ්වාසයෙන්ම පසක් කර ගනිමු.

**ඔබ සැමට ජේසු පිහිටයි !**

සංස්කාරක

ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා

# බාධක ජයගෙන ඉදිරියට යමු !




ආදර දුවේ පුතේ,

මා මෙද කැමතියි කොයිතරම් කරදර බාධක වලට මුහුණ දීමට සිදු වුවත් උත්සහය කැපවීම අධිෂ්ඨානය තුලින් ජීවිතය ජයගත් දියණියක් පිළිබඳව කථා පුවතක් ඔබත් සමග බෙද ගන්න.



ඇයව අපි සමන්මලී යන අනවර්ථ නාමයෙන් හඳුන්වමු. සමන්මලී ජීවත් වුයේ මීගමුව නගරයට නුදුරින් පිහිටා ඇති ධීවර ගම්මානයක. සමන්මලීගෙ පියාට ස්ථිර රැකියාවක් තිබුනෙ නෑ. ඔහු සුළුතුවාල වලට ප්‍රතිකාර කිරීම සිය ජීවන වෘත්තිය කරගෙන තිබුනා. එවගේම ඇයගේ පියා මත්පැන් වලට දැඩිව ඇබ්බැහි වී සිටියා. මේ පියා දිනපතාම මත්පැන් පානය කර සවස් යාමයේ වේග රිද්මයේ බයිලා ගායනා කිරීමටත් එයට අනුකූලව තාලයට නර්තනයන් ඉදිරිපත් කිරීමටත් පුරුදුව සිටියා. එහෙත් ආර්ථික ගැටලු දිනෙන් දිනම වැඩිවීමත් සමග මැද පෙරදිග ගෘහ සේවිකාවක් ලෙස සේවය කිරීමට මව අවසාන වශයෙන් තීරණය කළා.

අවසානයේදී ශ්‍රවනාබාධිත එකම සොහොයුරාත් බේබදු පියාත් සමග සමන්මලී තනි වෙනවා. එහෙත් ඉගෙනීමට සමන්මලීට තිබූ ආශාව උනන්දුව ඇය දිනෙන් දිනම වැඩි කර ගන්නවා. හරිහැටි කුසට අහරක් නොලැබුනු සමන්මලී දිනෙන් දින ඇල්මෙන් අකුරු ඉගෙනීමේ ප්‍රතිඵලය වුයේ ඇය සාමාන්‍ය පෙළ විභාගය ඉතා උසස් ලෙස සමත් වීමය. ඉන් අනතුරුව ඇය තීරණය කරනවා උසස් පෙළ විද්‍යා අංශයෙන් හදරන්න. උසස් පෙළ විභාගයෙන්ද ඉතා උසස් ලෙස සමත් වන ඇය කොළඹ වෛද්‍ය විද්‍යාලයට ඇතුළත්වී ඉතා දක්ෂ වෛද්‍යවරියක් බවට පත් වෙනවා. ආදර දුවේ පුතේ, ජීවිතය ජය ගන්න ජීවිතය දිනා ගන්න දුක් කරදර බාධකයන් නොවේ. වඩා වැදගත් වන්නේ පිරිසිදු චේතනාවෙන් යුතුව උදර අරමුණු ඇතිව උත්සහයෙන් සහ කැපවීමෙන් යුතුව ක්‍රියා කිරීමය. එසේ ඔබත් ජීවිතය ජය ගන්න උත්සහය කැපවීම අධිෂ්ඨානය ජීවිතයේ අවියක් කොට ගන්න. එවිට ඔබේ ජීවිතය අදට වඩා හෙට සුන්දර වේවි.

✍ ජී .ඒ නිමාලි ප්‍රනාන්දු - ගුරු මව

## ක්‍රිස්තුරාජ ජාතික පාසල් විදුහල් දිනය


තුඩැල්ල ක්‍රිස්තුරාජ ජාතික පාසලේ විදුහල් දිනය හා ක්‍රිස්තුරජාණන්ගේ මංගල්‍යය ජා ඇල කලාපිය නාහිමි අතිගරු ශාන්ති කුමාර වැලිවිට පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ.



මංගල්‍ය මහා පූජා මෙහෙයෙන් පසු ක්‍රිස්තු රජාණන්ගේ ප්‍රතිමාව රැගත් පෙරහර විද්‍යාලයීය ක්‍රීඩාංගනය වටා සංචාරය කළ අයුරු.

ලෝරන්ස් ප්‍රනාන්දු

## සඳ වැජඹේවා පාසල් මව්නි




**අතරමං වූ ජීවිත කතරේ**
**පිළිතුරක් ලෙසින් මඟ පැහැදු**
**පුංචි පාසල් දිවිය පහන්ටැඹක්**
**වුයේ මගේ සනදුරු මාවතටයි**
**හැඬු කඳුලින් පාසලට ආ**
**පළමු දිනේ කරදරයක් ලෙස**
**සිතුවෙමි මගේ කෙළිලොල් වියට**
**අඩියෙන් අඩිය පා තබමින් ඉදිරියට පැමිණි**
**මට පසුව හදවතට දැනෙන්නේ**
**අධ්‍යාපනය නැමැති විශ්විය කිරි සයුරේ වටිනාකමයි....**
**දිය බිඳුවක් විලසින් පැමිණි මම**
**දිය ඇල්ලක් තරම් දැනුම ලබා**
**ගත්තේ මෙම පාසල් ජීවිතයෙන් ය......**

නිමෝෂා පිපුනි ජයමල්
12 ශ්‍රේණිය - (කලා අංශය)
දංකොටුව බාලිකා මහා විදුහල

# පයාගල සුරදූතික බාලිකාවියන්ට ලේඛක වැඩමුළුවක්






පසුගියදා පයාගල සුරදූතික බාලිකා අපේක්ෂාවේ 6 ශ්‍රේණියේ සිට ඉහළ ළමුන් සඳහා විදුහල් ශාලාවේදී ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතාගේ මෙහෙය වීම යටතේ ළමා ලේඛක වැඩ මුළුවක් පැවැත්වින. මෙහිදී ජනසන්නිවේදනය, පුවත්පත් කලාව හා නිර්මාණකරනය ගැන අවබෝධයක් ලබා දුනි. සිසුවියන්ට තම නිර්මාණ හැකියා ඔප්නංවා ගනිමින් නිර්මාණයන් කිරීමේ ක්‍රියාකාර කම් සඳහා ද කාල වේලාව වෙන් කර දීම විශේෂ විය.

මෙම වැඩසටහන ඔහු එදින ළමා අපට සැම අතින්ම ප්‍රයෝජනවත් අන්දමින් සියල්ලන්ගේ සිත් ඇදගන්නා සුළු ආකාරයෙන් පැවැත්වීය. එමෙන්ම එදින එම වැඩසටහන තුළින් අනාගතයේදී පුංචි ලේඛිකාවන් වීමට බලාපොරොත්තුවෙන් සිටින අප පාසලේ සියළුම දෙනාට තම හැකියාවන් දියුණු කර ගැනීමට මහා තෝතැන්නක් විය. එලෙසම පුවත් පතකට ලිපියක් ලියන විට පාඨකයාගේ සිත තුළ රුචිය, ප්‍රියමනාප බවක් ඇති වන අන්දමින් ලිපියක් ලියන ආකාරය ගැන ඔහු ඉතාමත් සරලව අපට පැහැදිලි කළේය.


මේ අවස්ථාවට විදුහල්පතිනි ගරු මේරි පෝල් පැවදි සොයුරියද එක්වූවාය.

ගරු මේරි ඇලෝෂියා පැවදි සොයුරිය මෙම වැඩමුළුව සංවිධානය කළ අතර මෙරිනා සුදර්ශනි, දිස්නා පියුමාලි යන ගුරු මෑණිවරුන් මේ සඳහා සහයෝගය ලබා දුනි.

**මලීෂා කෞෂානි**

**ඉෂාරා ෂෙහානි ෆොන්සේකා**

සුරදූතික බාලිකා අපේක්ෂාවේ පාසල - පයාගල



## ළමා ප්‍රදීපය, නත්තල් කලාපය

**ළමා ප්‍රදීපය නත්තල් කලාපය සඳහා නත්තල හා බැඳුනු ළමා ඔබගේ නිර්මාණ දෙසැම්බර් මස 10 දිනට පෙර**

**ළමා ප්‍රදීපය "නත්තල් කලාපය" අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08. යන ලිපිනයට අප වෙත එවන්න.**

**සංස්කාරක පියතුමා**

**නොහික්මුනු රියදුරෙක් නිසා අපෙන් සමුගත් හලාවත පදවියේ කන්ජුක්කුලිය සා. බෙනඩික්ට් දහම් පාසලේ 10 ශ්‍රේණියේ ඉගෙනුම ලැබූ ඉසුරිකා අක්කා වෙනුවෙන් ඇගේ නංගි ළමා ප්‍රදීපයට විශේෂයෙන් ලියු කවි පංතියකි.**

## ඉසුරිකා අක්කේ

දහම් පාසලේ නත්තල් නැටුමට
හවසට එන බව කිවුවා පුහුණුවට
මුදල් සොයන්නට තරගයට පැදවුන
බස් රථයෙන් ඔබ විසිවුනෙ ඉවතට

නංගිත් සමගින් වැටුණා බිමටම
වැදුනා හිස ඔබේ පාරේ තදටම
දිවි රැක ගන්නට යෙදුනා සටනක
ආයෙ නොඑන්නට ගියෙ ඇයි අප හැර

සිහිනයක් වගේ තාමත් මෙය මට
මළසිරුරින් බෑ හඳුනා ගන්නට
වත ඔබෙ මෙන් නොව වෙන කෙනෙකුගෙ මෙනි
තාමත් සිතනවා ඉන්නවදෝ ඔබ

සුන්දර මුහුණේ සුරතල් සිනාව
දෙනෙතේ රැඳුනේ ඒ ලෙංගතු බව
අක්කෙක් වුවත් මගෙ හොඳ මිතුරිය
කෙදින දකින්නද නැවතත් ඔබේ වත

ජේසු කැඳව ගත්තද අක්කේ ඔබ
ඇයි ද ගියේ අපහට දී මේ දුක
පූජාවේදි ගීතිකා ගයන්නට
නැවතත් එන්නේ කවදාදෝ ඔබ ........

**ඔබ නැති සොවින් තැවෙන තරුෂි නංගි**

**සා. බෙනඩික් දහම් පාසල, කන්ජුක්කුලිය**

# අපේ මිතුරා

පොතපත අප මිතුරන්ය
එය කියවීමෙන් අපට
දැනුම ලැබෙයි සැමවිටම
අපතෙ නොයයි ඒ දැනුම



දැනුම ගබඩා කරන
ගබඩාවක් වැනිය එය
එයින් ලැබෙන මනා දැනුම
සතුරනට නොහැකිය ගන්නට

රූප පෙට්ටියෙන් නොලැබෙන
සතුට ලැබෙයි එයින් අපට
පොතපත කියවමු අප සැම
ගනිමු එයින් ලැබෙන දැනුම

**දිසාරා දිල්හාරි ද සොයිසා**
7 ශ්‍රේණිය
ශු. මිඛායෙල් අග්‍රදූත දහම් පාසල - නාගොඩ

# නාගොඩ (කළුතර) ශු. මිඛායෙල් අග්‍රදූතතුමන්ගේ දහම් පාසලේ ශූර ළමා ලේඛකයෝ (වැඩමුළුවක ප්‍රතිඵලයක්)

# දෙවිඳුනි,

දෙවිඳුනි ඔබේ පෙම මහිමාන්විතයි
පව්බර අප වෙනුවෙන්
මිනිස් බව ගත් දෙවිඳුනි
පිදුවා ඔබ ඒ යාගය
මැරුණා ඔබ ඒ පුදසුනේ
අපේ පාප සියල්ල ඉසිලූ
දෙවිඳුනි ඔබයි මා ගැළවුම් කරු
ඔබේ පෙම තේජාන්විතයි
මාගේ දෙවි පියාණනී
පුදනෙමි මා ජීවිතය
ඔබේ පෙම මුළු ලොව පතළ කරන්නට




**ලහිරු ඩේමියන් පෙරේරා**
9 ශ්‍රේණිය
ශු. මිඛායෙල් අග්‍රදූත දහම් පාසල - නාගොඩ

# ඔබයි මගේ රජිඳුණෝ

නිසල සිතුවිලි ගලා යන විට
හදෙහි පැතුමන් බොඳවී
නොයනා විට
දුක, බාධක, අභියෝග මැද
දිවිය ගෙවන විට ඔබමය
මගේ රජිඳ
සමිඳේ ......
දුබල මා පව් කළ විට
අසරණ වූ පසු ඔබ වෙතට
පැමිණියෙමි
එහෙත් සමිඳුනි ඔබ .........
මා අත නෑරියේ මන්ද
ඔබේ ප්‍රේමය මෙතරම් මා
වටලා ගෙන ද.........
ආසයි සමිඳුනි, ඔබ වෙත
එන්නට
ඔබට ඇපකැපව ජීවත් වෙන්නට
මා පිළිගත මැන සැමද .........
කළ මැන කරුණා
පාපි , දුබල , මා වෙත
මාගේ ආදර රජිඳුණෝ



**නෙළුම් නිසංසලා පිරිස්**
10 ශ්‍රේණිය
ශු. මිඛායෙල් අග්‍රදූත දහම් පාසල - නාගොඩ

# තුති පුදමි ඔබට

තාරකා දහස් ගණන් - ඇත අහස පුරා
එනමුදු එළිය - නැත අඳුර දුරලන්න
සඳ කැලුම් මෝදුව - දිනක මෙන් බබලන්න
නැණ පහන් දල්වන්න - සෙනෙහසින් දයාවෙන්
සිප් සතර දී අපට - දිරිය දුන්නේ ඔබයි
සිහිකරමි ඔබේ ගුණ - දයාබර වූ හදින්.......


**ඈන් ඉෂානි තමෙල්**
8 ශ්‍රේණිය
ශු. මිඛායෙල් අග්‍රදූත දහම් පාසල - නාගොඩ

**ශුද්ධවූ අන්තෝනි මුනිතුමා**
අමාෂි දෙව්මි ප්‍රනාන්දු
6 - ශ්‍රේණිය
ශු. මිඛායෙල් අග්‍රදූත
දහම් පාසල
නාගොඩ






කොළඹ ශාන්ත බෙනඩික් විදුහලේ 10 ශ්‍රේණියේ සිසු හිමංෂු දෙව්රුවන් හපුආරච්චිගේ කුළුඳුල් කාව්‍ය සංග්‍රහය දැන් නිකුත් වී තිබේ. කවිය තමනට දෙවිඳුන් ලැබදුන් තිළිණයක් සේ සලකන බව හැඳින්වීමෙහි සඳහන් කරන දෙව්රුවන් මෙම කාව්‍ය සංග්‍රහයට විවිධ තේමාවන් ඔස්සේ පබැඳුණ කවි වැල් රැසක් ඇතුළත් කොට තිබේ.




''නත්තල් දා රෑ '' මැයින් පබැඳුණ කවි සංකල්පනාවේ.
''නත්තල් දා රෑ බෙත්ලෙහෙමේ ආකාසේ තරුවක් වෙලා මට ඉන්නට තිබුණා නම් දැක ගන්නට තිබුණා ගව ඔරුවේ සැතපුණ ජේසු තුමා '' ලෙස රචනා වී ඇත්තේ ළමා මනසට ගෝචර ඉතා අපූරු අදහසකි.

**කැලිස්ටස් ජයමාන්න විසිනි**

''සඳවතුර'' කවි පන්තියේ මව් ගුණ ගැයෙන්නේ මෙසේය.

බාලේ සඳ දියකර පොවලා අප තනනුව වෙහෙසුණු මව්නේ කඳු පර්වත නැග - සඳ මිරිකාගෙන සඳ වතුර කළය පුරවා ගත්තේ.

''පියාණෙනි'' යැයි කවියක් පබඳින සඳරුවන් ''ඔබගෙන් වැඩුණු මල් ගොමුවල සුවඳ දිගේ '' ඇදනෙමු අපිත් යහමග යන කඩුළු වගේ යැයි සඳහන් කරයි. ඔහුගේ බොහෝ කවි කල්පනා කිතු දහමෙන් ජීවය ලබයි. වැහිවලාව මා සමිඳේ එවැන්නකි. එසේම දේශානුරාගය දනවන ''මගේ රට'' ''ලංකා රට ගිය සිංහලයා'' ''සිංහල කොඩිය'' බඳු නිර්මාණ ද අගය කළ හැකිය.

## ''සඳ වතුර ''කාව්‍ය සංග්‍රහය
## කර්තෘ - හිමංෂු දෙව්රුවන් හපුආරච්චි

දහවන වසරේ සිසුවකුගෙන් මහා කවීත්වයක් අපේක්ෂා කිරීම වරදකි. එහෙත් දෙව්රුවන් තෝරා ගන්නා විෂයයන් හා ඔහුගේ බස් හැසිරවීම තුළ අගනා වියත් කවියකුගේ අංකුර ලක්ෂණ බොහෝ සේ පිළිබිඹු වන බව කිවහැකිය. නිසදැස් වුවද රිද්මයකට ගැයිය හැකිසේ ලියන්නට ඔහු වෙහෙස ගෙන ඇත. ගුරුවරුන්ගේ උපදෙස් ලබා ගත්තේ නම් ඇතැම් කවි වල බස තවදුරටත් කාව්‍යෝචිත කර ගත හැකිව තිබිණි යැයි අපට හැඟේ.

---

**පයාගල හා බොල්ලතදී පැවැත්වූ ළමා ලේඛක වැඩමුළුවන් හි තවත් සාර්ථක නිර්මාණයන් ....**

## අහිමි මව් සෙනෙහස

**හිරු කිරණින් අවදි වූ මා හට දැණුනේ**
**පාළුව හා තනිකමයි මම දුටුවේ**
**ඇය මා අසල නැති බවයි**
**මා තනිවූ බව මට හැඟෙයි**
**වෙනදා පිවිතුරුව තිබු පරිසරය**
**අද මලානික වී ඇති බව මම දුටුවෙමි**
**මට හැඟුණේ ඇය නැති පාළුව**
**පරිසරයටත් දැනෙන බවයි**
**කිමද මව්නි ඔබ මා මෙලෙස තනි කළේ**
**ඔබේ සිනා මා මුවෙහි ඇඳෙනා විට**
**ඔබේ කතා සිහියට නැගෙන විට**
**සිතට ගෙන දෙන්නේ දුකකි**
**විගස මා ළඟට එන්න මව්නි**
**මේ ඔබේ ආදර දියණියයි**



**ඇන් ඉෂානි තමෙල්**
8 ශ්‍රේණිය
සුරදූතික බාලිකා
අපේක්ෂාවේ පාසල
පයාගල

## උදයක අසිරිය

හිරු කන්දෙන් එබී බලයි
කුරුල්ලෝ කෑ ගස ගසා පියඹයි
මල් පිපිලා උදය විකසිත කරයි
පුංචි ළමෝ උදය අවදි වෙයි
දත් මැද මුහුණ සෝදා ඇඳුම් අඳියි
දෙමව්පියන්ට වැඳ ගෙදරින් යයි
කොක්කුවගේ පාසල් යයි
පාසලට ගොස් ඉගෙන ගනියි

කල්පනි
නවෝද්‍යා
6 ශ්‍රේණිය සිරිහඳ
දහම් පාසල
බොල්ලත

### ආදර මගේ ජේසුනි

ආදර මගෙ ජේසුනි, ඔබ පුදදෙමි ආදරෙන් සමිඳේ
ගැලවුම් කරුවාණනි, දෙව්පුත් වූ ජේසුනි සමිඳේ
මිනිසාගේ පව් නිසා කුරුස ගසේ දිවිපිදූ සමිඳේ

අරෝෂා මදුෂානි - 6 ශ්‍රේණිය
සුරදූතික බාලිකා අපේක්ෂාවේ පාසල - පයාගල

# ශිෂ්‍ය නායක නායිකාවන්ට එක්දින වැඩමුළුවක්



වයික්කාල , වෙන් / තඹරවිල කනිටු විදුහලේ හා දන්කොටුව , වෙන්/ හාල්දැඹුවන රෝමානු කතෝලික විදුහලේ ප්‍රාථමික හා ජ්‍යේෂ්ඨ ශිෂ්‍ය නායක නායිකාවන් හට එක් දින වැඩමුළුවක් පසුගියදා වයික්කාල දිව්‍ය සංරක්ෂණ දියණියෝ නිකායික කන්‍යාරාමයේ ප්‍රධාන ශාලාවේදී පැවැත්වුණි. මෙය මෙහෙයවනු ලැබුවේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක දේශක , කුමර නයනජිත් මහතාය.

මෙයට එක්වූ සිසු නායක නායිකාවන් ඇමතූ කුමර මහතා ශිෂ්‍ය නායකයකු යනු කවුරුන්ද, ශිෂ්‍ය නායක භූමිකාව හා වගකීම් යන ආදි කරුණු රැසක් පිළිබඳව දැනුවත් කළ අතර සියලු ළමුන් කණ්ඩායම් වලට බෙදා අභ්‍යාසයක්ද පැවැත්විය. මීට එක් වූ 8 වන ශ්‍රේණියෙන් ඉහල ළමුන් සඳහා දේශක මහතා වැඩමුළුව අවසානයේදී "යොවුන් විය හා නූතන ජනමාධ්‍ය භාවිතය" පිළිබඳව විශේෂ දෙසුමක්ද පැවැත්විය.

මෙම වැඩමුළුව හලාවත පදවි කතෝලික පාසල් අධ්‍යාපන සහයක ගරු ධනුෂ්ක ප්‍රනාන්දු පියතුමන්ගේ අදහසකට අනුව තඹරවිල කනිටු විදුහලේ හා හාල්දැඹුවන රෝමානු කතෝලික විදුහලේ , විදුහල්පති ෂෙල්ටන් ප්‍රනාන්දු මහතා, විදුහල්පතිනි ලයන් ප්‍රනාන්දු මහත්මිය සංවිධානය කළහ. මෙයට එක්වූ සිසු නායක නායිකාවන් ගරු පියතුමන්, දේශක මහතා පාසල් හි ප්‍රධානින් හා මීට සහය වූ ගුරුවරියද සමග ළමා ප්‍රදීපය සඳහා සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු.

**ශිෂ්‍ය නායක සංගමය - තඹරවිල කනිටු විදුහල**

## මොරටු දිසා ධර්මදූත කැරොල් තරඟ ප්‍රතිඵල

මොරටු දිසා ධර්මදූත ළමා සමාජයේ කැරොල් සමූහ , හා ඒකල ගයනා තරඟ පසුගියදා කඩලාන ශාන්ත අන්තෝනි මුනි දේවස්ථානයේ ජුබිලි ශාලාවේදී පැවැත්වුණි. මෙහි පදවි තරගය සඳහා සුදුසුකම් ලබමින් දිසාවේ ප්‍රථම ස්ථානය කඩලාන මීසම දිනාගත් අතර දෙවන හා තෙවන ස්ථාන පිළිවෙලින් ලුනාව, හා කටුකුරුන්ද මීසම් විසින් දිනා ගත්හ.

අසික ප්‍රියදර්ශන

## වැස්ස

එහෙ මෙහෙ අත ගස් සෙලවෙයි
වැහිලිහිණියෝ එහෙමෙහෙ යයි
සීතල අප සැමට දැනෙයි
වැහි බිඳු බිඳු බිමට වැටෙයි

ගස්වැල් සැම දළු දා එයි
පරිසරයද තෙතබර වෙයි
සුළඟින් හැම පිරිපුන් වෙයි
නවමු පණක් අපට ලැබෙයි



ඉමේෂ් මධුමාල් හපුතන්ත්‍රි
10 ශ්‍රේණිය
සාන්ත මරියා දහම් පාසල - නායකකන්ද

## කිතුනු උරුමය

# යාපනයේ අප ස්වාමි දූ

පෘතුගීසීන් පලවා හැර ලංදේසීන් විසින් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පෙදෙස් අල්ලා ගන්නා කාලය වන විට යාපනයේ පමණක් දේවස්ථාන 25 ක් තිබූ බව සඳහන් වෙයි. ලංදේසීන් විසින් කළේ මෙම දේවස්ථාන වලින් බොහොමයක් කැල්වින්වාදි ඕලන්ද සභාවේ දේවස්ථාන බවට හැරවූ අතර ඉතිරිවා රජයේ විවිධ කාර්යයන් සඳහා යොදා ගැනීමයි.

දේවස්ථාන විනාශ නොකළද , ලංදේසීන් විසින් දේවස්ථාන වල තිබූ පූජාභාණ්ඩ සහ සුරුවම් ආදිය විනාශ කර දමන ලදී. එසේ විනාශ කිරීමට පෙර පෘතුගීසීන් විසින් සමහරක් දේ රටින් පිටතට ගෙනයන ලදි. එසේ ගෙන ගිය දේවල් අතර දේව මාතාවන්ගේ ලී සුරුවමක් ද විය . එය තිබී ඇත්තේ යාපනයේ සිල්ලාලෙහිය. පෘතුගීසීන් විසින් එම ලී සුරුවම ගෙනගොස් තැන්පත් කොට ඇත්තේ පැරණි ගෝවේ දේවස්ථානයකය.

මුලදී ගෝවේ සිටි කිතුනු ජනතාව මෙම සුරුවම හඳුන්වා ඇත්තේ 'යාපනයේ අප ස්වාමිදු'' වශයෙනි. කෙසේවුවද මෙම දේව මාතා සුරුවම අභියස යාච්ඤා කළ බොහෝදෙනා ලෙඩ රෝග වලින් සුවය ලැබූ නිසා, පසු කලක එය ප්‍රාතිහාර්යයේ අප ස්වාමිදු වශයෙන් හඳුන්වා ඇත. ගෝවේ ඇති විශාල දේවස්ථාන සමූහය මැද පසු කලක මෙම සුරුවම පිළිබඳ මතකය බොහෝ දෙනාගේ සිතින් ගිලිහී ඇත. සුරුවම පිළිබඳ දන්නා අයගේ සංඛ්‍යාව අතලොස්සක් පමණක් විය. මෙයට වසර දෙකකට පමණ ඉහතදී ශ්‍රී ලංකාවෙන් ගෝවට ගෙන ගිය සුරුවම් පිළිබඳ විස්තරයක් මැසෙන්ජර් සති පතා කතෝලික පුවත්පතේ පළවී තිබෙනු මතකය. මේ නිසාම වසරක් පාසා ගෝවට වන්දනා ගමනක් සූදානම් කරන , භාග්‍යවන්ත ජුසේ වාස් ජාතික කාර්යාලයේ ලේකම් සහ සාමාජිකයකු වන රොගී කොරේරා මහතා සහ ෂෙල්ටන් ප්‍රනාන්දු මහතා මෙම සුරුවම් ඇති තැන සෙවීමට උත්සාහයක් ගන්නා ලෙස , භාග්‍යවත් ජුසේ වාස් තුමන් ශුද්ධවරයට එසවීම් පිළිබඳව ගෝවේ සිට




සේයා :- අසේල දසනායක





**දේවස්ථාන විනාශ නොකළද , ලංදේසීන් විසින් දේවස්ථාන වල තිබු පූජාභාණ්ඩ සහ සුරුවම් ආදිය විනාශ කර දමන ලදී. එසේ විනාශ කිරීමට පෙර පෘතුගීසීන් විසින් සමහරක් දේ රටින් පිටතට ගෙනයන ලදී. එසේ ගෙන ගිය දේවල් අතර දේව මාතාවන්ගේ ලී සුරුවමක් ද විය . එය තිබී ඇත්තේ යාපනයේ සිල්ලාලෙහිය. පෘතුගීසීන් විසින් එම ලී සුරුවම ගෙනගොස් තැන්පත් කොට ඇත්තේ පැරණි ගෝවේ දේවස්ථානයකය.**

ක්‍රියා කරන ගරු රිබෙල්ලෝ පියතුමාගෙන් ඉල්ලීමක් කොට ඇත. ඉල්ලීම පිළිගෙන ඒ සඳහා වෙහෙසුණු රිබෙල්ලෝ පියතුමාට මෙම දේව මාතා සුරුවම ඇති දේවස්ථානය සොයා ගැනීමට හැකි වී ඇත. එය තැන්පත් කොට ඇත්තේ පැරණි ගෝවේ ශාන්ත පීතර දේවස්ථානයේයි.

භාග්‍යවත් ජුසේ වාස් ජාතික කාර්යාලයෙන් සංවිධානය කොට , ගෝවේ වන්දනා ගමනක යෙදුණු පිරිසට මෙම ඓතිහාසික දේව මාතා සුරුවම දැක ගැනීමට හැකි විය. මේ සමග දැක්වෙන්නේ යාපනයේ සිල්ලාලේ සිට ගෝවට ගෙන ගොස් දැනට පැරණි ගෝවේ ශාන්ත පීතර දේවස්ථානයේ සිට ගරු බුහුමන් ලබන යාපනයේ අප ස්වාමිදූ හෝ ප්‍රාතිහාර්යයේ අප ස්වාමිදූ නමින් දැක්වෙන දේව මාතා දැව සුරුවමයි.

**භාග්‍යවත් ජුසේ වාස් පිය ජාතික කාර්යාලයේ සාමාජික**

**✍ ගරු ජයලත් බලගල්ල පියතුමා**

## සා. ජෝශප් විදුහල් නත්තල් කැරොල් දෙසැම්බර් 8 වන ද ශ්‍රවණාගාරයේ

මරදන , සා. ජෝසප් විදුහලේ වාර්ෂික කැරොල් ගායනා මෙහෙය ස්ටැන්ලි අබේසේකර ශ්‍රවණාගාරයෙදී දෙසැම්බර් මස 8 වන සෙනසුරාද සවස 6.15 ට පැවැත්වීමට නියමිතය. මෙම කැරොල් ගායනා මෙහෙය දෙවිඳුන් හට පුද දෙමින් අර්ථවත් මෙහෙයක් කිරීමට ගායනයෙන් පාසලේ සා. සිසිලියා ගායනා කණ්ඩායමේ මූලිකත්වයෙන් , ප්‍රාථමික ගායනා කණ්ඩායම, ආචාර්ය මණ්ඩලයේ හා ආදි ශිෂ්‍යයන්ගේ ගායනා කණ්ඩායම සූදානමින් සිටිති. මෙම මෙහෙයේ නත්තල් පණිවුඩය ලබා දෙනුයේ ප්‍රධාන ආරාධිත මුලසුන හොබවන මහ නුවර රදගුරු අති උතුම් වියානි ප්‍රනාන්දු හිමිපාණන් ය.

මෙවර ගැයෙන සිංහල , දමිළ, ඉංග්‍රිසි, ඉතාලි හා ජර්මන් භාෂා වලින් සැකසුනු කැරොල් ගායනයන් තුළින් නත්තලේ සැබෑ අරුත, සැදැහැවත් ජනතාවගේ හදට හා ජීවිතයට සමීප වේවා!

මාසික සිතිවිල්ල



සේයා :-
ශ්‍රියංගනී පිලීෂියා

**මාසික සිතිවිල්ල**

“නොවැම්බර් මාසය” ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

**ජයග්‍රාහී නිර්මාණය ලබන සතියේ පළ කෙරේ**



# ඉංග්‍රීසි පාඩම විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා

ඉදිරිපත් කිරීම
මයිකල් ඇන්ජලෝ
ප්‍රනාන්දු විසිනි.

පාඩම් අංක : 79

## Prepositions and Places
## නිපාත පද සහ ස්ථාන

41. Every evening she sits .... the window and watches the sunset.
හැම හවසකම ඇය ජනේලය ළඟට වෙලා ඉඳගෙන හිරුබහිනව බලා ඉන්නවා.

42. She is wearing a ring... her middle finger.
ඇය මැදඟිල්ලේ මුදුවක් පැළඳගෙන ඉන්නවා.

43. There is a scar his left arm.ඔහුගේ වම් අතේ කැළලක් තියෙනවා.

44. Beruwala is.... the south coast of Srilanka.
බේරුවල තියෙන්නේ ශ්‍රී ලංකාවේ දකුණු මුහුදුබඩ තීරයේ.

45. Let's sit ..... the front of the hall.
අපි ශාලාවේ ඉදිරියෙන් වාඩිවෙමු.

46. But don't sit .... the front row.
ඒත් පළමුවැනි පේලියේ වාඩිවෙන්න බෑ.

47. I met Sunitha ..... a party. මට සුනීතව මුණගැහුණා පාටියකදී.

48. We saw a film .... the "Regal" cinema yesterday.
අපි රීගල් සිනමාහලේ චිත්‍රපටියක් බැලුවා.

49. There are four rooms... Jagath's house.
ජගත්ගෙ නිවසේ කාමර 4 ක් තියෙනවා.

50. I kept the T.V. ...... corner of my room.
මම ටීවී එක කාමරේ කොනෙන් තිබ්බා.

### අභ්‍යාසය සඳහා පිළිතුරු

1. The fly is on my nose.
2. The car stopped at the signal lights.
3. The cat sleeps on the floor.
4. The key is in the door.
5. The notice is on the notice board.
6. Children are playing on the beach.
7. The label is pasted on the bottle.
8. A beggar is standing at the gate.
9. Jayantha is standing in a queue.
10. Somasiri is at the back of the queue.
11. Namali is standing at the top of the stairs.
12. Namalee's sister is standing at the bottom of the stairs.
13. The Eiffel Tower is in France.
14. There is a fan on the ceiling.
15. There are many flowers in the garden.
16. There is some sugar in the bottle.
17. Mr. Perera lives in this building.
18. His flat is on the 3rd floor.
19. He is sitting in the back row of the Church.
20. Shanthi is standing at the corner of the super market building.
21. She sat in the back of the car.
22. Nalin is looking (a) at his face (b) in the mirror.
23. The bank is on the left.
24. The hospital is on the right.
25. Basil works on a farm.
26. There are no clouds in the sky.
27. In Srilanka we drive on the left.
28. What is the highest mountain in the world?
29. I met Keerthi on my way to work.
30. Please write your name on the back of the envelope.
31. Henry always sits at the back of the class.
32. Don't allow the children to play in the street.
33. Sunila is not in this photograph.
34. As you come out of the lift, my room is on the left.
35. Write your name at the top of the page.
36. I like that picture hanging. (a) on the wall (b) in the Kitchen.
37. I saw that article on the back page.
38. There is nothing interesting in today's newspaper.
39. There was an accident at the crossroads today.
40. Please stop the car at the next hotel. I want to eat something.
41. Every evening she sits at the window and watches the sunset.
42. She is wearing a ring on her middle finger.
43. There is a scar on his left arm.
44. Beruwala is on the south coast of Srilanka.
45. Let's sit at the front of the hall.
46. But don't sit in the front row.
47. I met Sunitha at a party.
48. We saw a film at the "Regal" cinema yesterday.
49. There are four rooms in Jagath's house.
50. I kept the T.V. in the corner of my room.

# ගොඩැල්ල අභිවෘද්ධි ආලේපය ලැබූ දූ පුතුන් රදගුරු හිමිපාණන් අතින් ත්‍යාග ලබති.

දංකොටුව ගොඩැල්ල මීසමට අයත් යොවුන් දූ පුතුන්ට අභිවෘද්ධි ආලේපය ප්‍රසාද නිධානය දානය කිරීම පසුගියදා සලාපුර රදගුරු අති උතුම් දෙව්ශ්‍රිත වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන් අතින් ගොඩැල්ල සාන්ත සෙබෙස්තියන් මුනිදුන්ගේ දෙව් මැදුරේදී සිදුවිය. එම දරුවන් මෙම ප්‍රසාද නිධානය ලබා ගැනීමට සුදුස්සන් කිරීම පිණිස විවිධ පැතිකඩ තුළින් වැඩසටහන් මාලාවක්ද මීසම් සේවක ගරු මොරිස් ඇන්ඩර්සන් පියතුමාගේ මග පෙන්වීම සහ මීසම් සහායක ගරු දිනේෂ් දුමින්ද පියතුමන්ගේ සහයෝගයෙන් සංවිධානය කර තිබූ අතර එහි අවසන් වැඩසටහන ඥානාර්ථ ප්‍රදීපය හා ළමා ප්‍රදීපය පුවත්පත්හි සහය සංස්කාරක කුමර නයනජිත් මහතා විසින් මෙහෙය වන ලදී.

''නූතන මාධ්‍ය භාවිතය සහ තාරුණ්‍යය'' යන මැයෙන් කළ මෙම වැඩමුළුවට එක්වූ දූ පුතුන්ගේ සිත් ගත් බවක් දක්නට ලැබිණ. මෙම වැඩ මුළුව ඇසුරෙන් කුමර නයනජිත් මහතා එම පිරිස වෙත අභ්‍යාසයක් ලබා දෙන ලදී. මෙයට සාර්ථකව පිළිතුරු සැපයූ ළමුන් පහක් තෝරා ඔවුන්ට පුංචි ත්‍යාගයක් ලබා දෙන්නට ඒ මහතා කටයුතු කර තිබිණ. එම ත්‍යාගයන්ට පියතුමාගේ ත්‍යාගයන්ද සමගින් අභිවෘද්ධි ආලේපය දානය කිරීමේ දිව්‍ය පූජාවෙන් අනතුරුව පැවති උත්සවයේදී රදගුරුතුමන් අතින් පිරිනමන්නටද පියතුමා කටයුතු කර තිබූ අතර එහිදී උත්සවය ඇමතූ ගරු මොරිස් ඇන්ඩර්සන් පියතුමා ''නූතන මාධ්‍ය භාවිතය සහ තාරුණ්‍යය'' යන වැඩසටහන අප තරුණ දූ පුතුන්ගේ සිත් ඇදබැඳගත් බවත් මෙවන් වැඩ වැඩ සටහන් තව තවත් ඔවුන් වෙත ලබා දෙන ලෙසත් ඉල්ලා ඇති බවද පැවසීය

ඩබ්ලිව්. ඇන්ටන් ජෙරාඩ් ප්‍රනාන්දු



කොළඹ අගරදගුරු පදවිය




දුන්ගල්පිටිය ශා. මරිය මග්දලේනා දහම් පාසලේ දරු දැරියෝ 32ක් ප්‍රථමවරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූහ.

දුන්ගල්පිටිය මීසම් සේවක ගරු ක්ලෝඩ් වනසිංහ පියතුමා දිව බොදුන් ලැබූ ළමුන් සමග සේයාරුවකට පෙනී සිටි අයුරු.

සෙබස්තියන් පෙරේරා



තුඩැල්ල අඩක්කල මාතා දෙව්මැදුරේ දරු දැරියෝ 58 දෙනෙක් මීසම් සේවක ගරු සිසිල් කුමාර පියතුමන් අතින් ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූහ.

ගරු පියතුමන්ගේ අනුශාසකත්වයෙන් තුඩැල්ල නිමල මරිය දහම් පාසලේ ප්‍රධානි ගරු සෙලිනා පැවදි සොයුරියගේ මගපෙන්වීම යටතේ දහම් පාසලේ ආචාර්ය මණ්ඩලය එක්ව මෙය සංවිධානය කළහ. දිව බොදුන් ලැබූ දරුවන් සමග ගරු පියතුමා හා ළමුන් පුහුණු කළ ගුරුවරියන් සේයාරුවකට මුහුන දුන් අයුරු මෙහි දැක්වේ.

නිශාන්ත රෝසා



**දෙව්පියා මැවූ ලෝකය**
**ඔෂාධි කවින්ද්‍යා**
02 ශ්‍රේණිය,
ශාන්ත හෙලේනා
දහම් පාසල
හිරිපොකුණ



**අසීසියේ ශුද්ධවූ ප්‍රැන්සිස් මුනිතුමා**
**නිර්මාල් පෙරේරා**
3 ශ්‍රේණිය
සාන්ත සෙබස්තියන්
විදුහල - මොරටුව




**මරිය තුමී**
**නවෝද්‍යා ලක්මිණි**
6 ශ්‍රේණිය
හරිශ්චන්ද්‍ර ජාතික
පාසල - මීගමුව

**අප ආදර දේව අම්මා**
**ශානිකා දිල්රුක්ෂි**
10 ශ්‍රේණිය
ශු.මිඛායෙල් දහම්
පාසල
නාගොඩ , කළුතර





**කුලුරු කුඩුව**
**වෙනුර කවිශ්ක පෙරෙයිරා**
4 ශ්‍රේණිය
ශා. තෝමස් විදුහල
කෝට්ටේ



**දිව බොදුනින් පොෂණය වෙමු**
**කවිශා ප්‍රභානි ප්‍රනාන්දු**
04 ශ්‍රේණිය
හලා/ සාන්ත මරියා ප්‍රාථමික
බාලිකා විදුහල


**දෙව්පියා මැවූ ලස්සන ලෝකය**
**සිතිජ මිලාන්**
1 ශ්‍රේණිය
ශු. මිඛායෙල්
අග්‍රදුතතුමන්ගේ
දහම් පාසල
යටියන



**දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ**
**සසිඳු අයේෂ් ප්‍රනාන්දු**
1 ශ්‍රේණිය
රිතා දහම් පාසල
මා විළිය
(ජා - ඇල මීසම)




# ශු. ජෝන් බර්ච්මන්ස් මුනිතුමා



## සුදුවර චරිතයක් හඳුනාගනිමු

**වර්ෂ 1599 දී බෙල්ජියමේ සියස්ටි ග්‍රාමයේ සපතේරුවකුගේ පවුලක කුළුඳුල් දරුවා ලෙස උපත ලැබූ මෙතුමා, කුඩා කල සිටම පියතුමකු වීමට දැඩි ආශාවක් දැක්වීය.**



ඔහුට පසුව තවත් සහෝදරයෝ දෙදෙනෙක් පවුලට එකතු වූහ. වයස අවුරුදු 13 ක් වන විටම නිවසේ පැවති ආර්ථික අපහසුතා නිසා පුංචි ජෝන්ට රැකියාවක නිරත වීමට සිදුවිය. මෙසේ ඔහුට රැකියාව කිරීමට සිදුවුයේ මාලින් නගරයේ පිහිටි ආසන දෙව්මැදුරේ නීති සම්පාදනය කරන්නකුගේ නිවසේ මෙහෙකරුවකු ලෙසය.

මවගේ මරණයෙන් පසුව එකල පැවති නීතිය අනුග මනය කරමින් පියා සහ සොහොයුරන් දෙදෙනා සමග පැවදි දිවිය වැළඳ ගන්නා ලදී.

1615 දී ජේසු නිකායික විද්‍යාලයට ඇතුලත්වී වසරක් ඇතුලතදී ආධුනික තාපසයකු බවට පත්වීමට එතුමාට හැකිවූයේ එතුමා තුළ තිබූ සහජ දක්ෂතාවය නිසාමය. 1618 දී වැඩිදුර අධ්‍යාපනය සඳහා රෝමයට යවන ලදි.

මෙතුමා දෙව්සත්හල තුළ වඩාත් ඉක්මනින්ම ප්‍රසිද්ධ චරිතයක් බවට පත්වුයේ මෙතුමාගේ දැඩි භක්තිය හා ජ්වලිත කම නිසාය. මෙම ජ්වලිත භාවය නිසාම පුංචි දේවල් වඩාත් නිවැරදිව කිරීමට මෙතුමා මහත් සේ උනන්දු විය.

එම වසරෙදීම ඔහුගේ පියා පූජාත්වරය ලබා මාස 6කේ යනවිට මරණයට පත්විය. මෙම සිද්ධිය එතුමා දෙව්සත්හල් දිවියේ මුහුණදුන් වේදනාත්මකම සිද්ධියක් වුවද, කිසිවිටෙක අධෛර්යට පත් නොවීය. එබැවින් මෙතුමා තම අධ්‍යාපන කටයුතුවල වඩාත් උනන්දුවෙන් නිරත විය. කෙතරම් දක්ෂයකු වුවද මෙතුමා තුළ වූ බැහැපත්කම දෙව්සත්හලේ අනෙක් සිසුන් හට අභියෝගයක් විය.

බැහැපත්කම ප්‍රගුණ කරනු වස් දිළිඳුකම ආයුධයක් කරගත් මෙතුමා දිනක් ඇන්ට්වර්ප් නගරයේ සිට රෝම පුරවරයට පයින්ම ගමන් කළ බව සඳහන් වේ. දෙව්සත්හල් අතර පැවති විවාදයක් සඳහා මෙතුමාව තෝරාගත් නිසා, තම දෙව්සත්හල කෙසේ හෝ ජයග්‍රහණය කරවන්නෙමි යි යන්න අධිෂ්ඨාන කළ මෙතුමා මහත් කැපවීමෙන් ඒ සඳහා දිවා රෑ නොබලා පාඩම් කළේය. පැවති දැඩි ශීතලද නොතකා පාඩම් කිරීම නිසා එතුමා අසනීප විය.


විවිධ ප්‍රතිකාර සිදු කළද පලක් වුයේ නැත. දිනෙන් දිනම රෝගය උත්සන්න වූ අතර රෝගය කුමක්දැයි සොයා ගැනීමට පවා වෛද්‍යවරු අපොහොසත් වූහ. මෙලෙස රෝගය වැලඳී සතියකින් එතුමා ස්වර්ගස්ථ විය. ඒ 1621 අගෝස්තු 13 වන දිනදීය. එතුමා චීනයේ ධර්මදූත සේවය සඳහා ආශාවෙන් පසුවුවද එයට ප්‍රථම මරණයට පත්වුයේ සමහරවිට එය දෙවිදුන්ගෙ අභිමතය වූ නිසා විය හැකිය.

එතුමාගේ දේහය මිහිදන් කරනු ලැබුයේ ශු. ඉග්නාසියුස් මුනිදුන්ගේ දෙව්මැඳුරෙහිය. එතුමන්ගේ හදවත ලුමේන් දෙව්මැදුරෙහි තැන්පත් කර තිබේ. මෙතුමාගේ මැදිහත්කම තුළ සිදුවූ ප්‍රාතිහාර්යයන් හේතුවෙන් එතුමන්ගේ ඡායාරූපයේ පිටපත් 20,000 කට අධික ප්‍රමාණයක් මුද්‍රණය කර බෙදා හරින ලදි. 1888-11-26 වන දින මෙතුමාව ශුද්ධවරයට ඔසවනු ලැබීය.

**ශු. ස්නාවක ජුවාම්**
**පූජා සහයක සමිතිය**
**බම්බුකුලිය - තෝප්පුව මීසම**

# ප්‍රහේළිකා අංක

34



සැකසුම

තිළිණි
දුතිකා
පෙරේරා

හරහට

1. මෝසෙස්ගේ මරණයෙන් පසු ඊශ්‍රායෙල් ජනතාවගේ නායකයා වශයෙන් පත්වූයේ මොහුය.

3. ක්‍රිස්තුන් වහන්සෙ, මනස්ථාපනය නොවූ නගරවල වැසියන්ට කථා කරමින් ''දේව විනිශ්චය දවසේදී ඔබට වඩා .................... හා සිදොනයට සහනය ලැබෙන්නේ යැයි'' වදාළ සේක මෙහි හිස්තැනට සුදුසු වචනය

4. ක්‍රිස්තුස් වහන්සේ බොහෝ අවස්ථාවල මෙය කඩ කළ බවට විනධරයන් හා පරිසිවරු ක්‍රිස්තුන් වහන්සේට චෝදනා කළෝය

5. ''මගේ වියගහ කරට ගෙන මගෙන් ඉගෙන ගන්න'' එවිට ඔබට ........... ලැබෙනු ඇති'යි ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

7. දොළොස් වසරක් මහලේ රෝගයෙන් පෙළුනු ස්ත්‍රියක් ක්‍රිස්තුන් වහන්සේගෙන් සුවය ලබාගත්තේ මහත් විශ්වාසයකින් යුතුව මෙය ස්පර්ශ කිරීමෙනි.

පහළට

1. දේව මෑණියන්ගේ පියාගේ නම

2. ''මගේ පියාණන් වහන්සේගේ නිවාසයෙහි බොහෝ .......... ඇතැයි ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

3. ශු. බයිබලයේ නව ගිවිසුමෙහි ශු. පාවුළු තුමා විසින් යවනු ලැබූ හසුන් පත්වලින් එකකි.

5. තමන්ට විරුද්ධව පව් කරන සහෝදරයාට කමා විය යුත්තේ මෙම වාර ගණන දක්වා පමණ දැයි පේදුරු තුමා ක්‍රිස්තුන් වහන්සේගෙන් ප්‍රශ්න කළේය.

6. යක්ෂයා , ක්‍රිස්තුන් වහන්සේව පරීක්ෂා කරමින් ලෝනයේ සියල් රට රාජ්‍යයන් පෙන්වා මේවා කෙරෙහි මුළු ආදිපත්‍යයද ඒවායේ........ ඉසුරුද ලබා ගැනීමට නම් යක්ෂයාට නමස්කාර කරන ලෙස ඉල්ලීය. මෙහි හිස්තැනට සුදුසු වචනය

(මෙම ප්‍රහේළිකාව පිරවීමේදි පහත සඳහන් බයිබල් පාඨ උපයෝගී කරගත හැකිය. ශු. මතෙව් 11/18, ශු. ලූක් 4,8,9,6 , ශු. ජුවාම් 14,)

**ප්‍රහේළිකා අංක 34 සඳහා පිළිතුරු ලබන සතියේ**

## 2012 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

### පසුගිය සතියේ පළවූ පෙරහුරු ප්‍රශ්න පත්‍රයේ පිළිතුරු

01. 1 කොරෙන්ති 02. ජෙරමියා 03. ගීතාවලිය

04. එපීස 05. මනුෂ්‍යත්වයේ විශ්ව විද්‍යාලයය

06. වසරකට වරක්වත් පාපොච්චාරණය කරන්න

07. පි සහ ජේ සම්ප්‍රදායය ( පූජක / යාවිස්ත)

08. පූජාත්වරය / ආශිර්වාදකාර සන්ධානය

09. ප්‍රැන්සිස්කන් නිකාය 10. තිබිස්හි පාවුළු

11. මුදල් මගින් / වැඩ කිරීමෙන් / උරුම වශයෙන් / හුවමාරුවෙන් / තෑගී වශයෙන්

12. එඬේරික හෙවත් රාජකීය

13. පූජාත්වරය/ආශිර්වාදකාර බන්ධනය

14. බැහැපත්කම /කීකරුකම /නිර්භීත කම/බඹසර රැකීම

15. පාපය විනාශ කිරීම 16. ලොරෙටෝටෝ නිකාය

17. විශ්වාසයේ වසර

18. සියලු ජාතීන්ට එතුමා යුක්තිය ගෙනදීම / එතුමා උස් හඬින් කථා කරන්නේ වත් මොරගසන්නේවත් නැත.

19. මතෙව් /ලූක්

20. ගැලවීම නමැති හිස් වැස්ම පළඳගන්න / දේව වචනය නමැති කඩුව ගන්න/ ධර්මිෂ්ඨකම නමැති ළය වැස්ම පැළඳගන්න.

21. ශු. පාවුලුතුමා විසින් කොලොස්සි 1/24

22. ශුද්ධවූ ලියවිල්ල /සම්ප්‍රදායයන් /ශුද්ධවූ සහා ඉගැන්වීම්

23. සිතුවිලිවල අයිතිය / අපසතු දේවල්වල අයිතිය / හැඟීම්වල අයිතිය

24. ශ්‍රාවකයින් වෙනුවෙන් යැදුම

25. ජීවිතාන්තය දක්වා ප්‍රේමය කරන බව / එකිනෙකාට ගෞරව කරන බව


රජ කුමාරයයි කිඳුරු කුමාරියයි
කථාව: ආනන්ද කල්දේරා
25
මං හරිම දුකෙන් හිටියෙ.. ඔයාව බලන්න එන්න විදිහක් නැතුව..
මටත් එහෙමයි කුමාරි.. මේ පුංචි මාළිගාවෙ කොතරම් කෑම, බීම තිබුනත් හිතට සතුටක් නැහැ ඔයා දකින්ට නැතිව...
ඔයාගෙයි.. මගෙයි ආදරේ අපේ මෑණියන්ට දැනගන්න ලැබිලා... මන්ත්‍රකාරිගෙ කැඩපතින් ඔක්කොම බලාගෙන...
අපේ මෑණියො ඔයගොල්ලංගෙ නැව විනාශ කරන්න මන්ත්‍රකාරිගෙ මන්ත්‍ර බලෙන් මුහුද කැළඹලා මහා කුණාටුවක් එව්වා....
ඔයාගෙ නැවත් විනාශ වෙලා යාළුවො ඔක්කොම අතුරුදහන් වෙලා.. මට පුළුවන් උනේ ඔයාව බේරගන්න විතරයි....
මායි මන්ත්‍රකාරිගෙ දුවයි එකතු වෙලා තමයි මන්ත්‍ර කැඩපතෙන් බැලුවෙ.. ඔයාව බේරගන්න එයා මට හුඟක් උදව් කළා...

**ශු. ප්‍රැන්සිස් මුණිඳුන්ගේ**
**කතාව**

# අසීසි නගරයේ දිළින්දා

**03**

ඉදිරිපත් කිරීම -
ඇමල් ද සිල්වා -

